**"අභ්‍යාසලාභී උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන" යටතේ බඳවා ගත් උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ඌව පළාත් සභාවට අයත් සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2022**

ඌව පළාත් සභාවේ සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල පහත සඳහන් විෂයයන්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අංක 21/2076/315/033-I හා 2021.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/21/A1/01/2020 හා 2021.12.31 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව, මෙම නිවේදනයේ අංක 02 යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත් උපාධිධාරීන්ගෙන් හා ඩිප්ලෝමාධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2022.08.22 දින වේ.

පුරප්පාඩු විෂය ලේඛනය

| අ.අ | විෂය | විෂය කේත අංකය | සිංහල මාධ්‍ය පුරප්පාඩු | දෙමළ මාධ්‍ය පුරප්පාඩු |
|---|---|---|---|---|
| **06- 11 ශ්‍රේණිය දක්වා පුරප්පාඩු විෂයන්** | | | | |
| 1 | බුද්ධ ධර්මය | 1 | 13 | - |
| 2 | සිංහල | 2 | 43 | - |
| 3 | විද්‍යාව | 3 | 49 | 05 |
| 4 | ගණිතය | 4 | 56 | 22 |
| 5 | භූගෝල විද්‍යාව | 5 | 56 | 15 |
| 6 | කෘෂි ආහාර තාක්ෂණය | 6 | 46 | 14 |
| 7 | චිත්‍ර | 7 | 90 | 13 |
| 8 | නැටුම් | 8 | 29 | 16 |
| 9 | සංගීතය | 9 | 27 | 16 |
| 10 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 10 | 108 | 28 |
| 11 | ඉතිහාසය/දේශපාලන විද්‍යාව | 11 | 42 | 12 |
| 12 | ව්‍යාපාර හා ගිණුම්කරණය | 12 | 39 | 12 |
| 13 | නාට්‍ය හා රංග කලාව | 13 | 06 | - |
| 14 | හින්දු ධර්මය | 14 | - | 08 |
| 15 | ඉස්ලාම් | 15 | - | 03 |
| 16 | ක්‍රිස්තියානි | 16 | - | 01 |
| 17 | දෙමළ භාෂාව | 17 | - | 06 |

01. **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

1.1 අයදුම්කරු /අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

1.2 යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.3 2019.12.31 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

02. **අයදුම් කළ හැකි කාණ්ඩයන් :-**

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු හා ඌව පළාත තුළ මධ්‍යම රජයේ ආයතනවල සේවයේ නියුතු,**

1.1 "උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන" 2020 හා 2021 යටතේ බඳවා ගනු ලැබූ සියළුම උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන්.

1.2 2018 සහ 2019 වර්ෂවල ක්‍රියාත්මක කළ "අභ්‍යාසලාභී උපාධිධාරීන් හට රජයේ ආයතනවල පුහුණුවක් ලබා දීම" වැඩසටහන යටතේ උපාධිධාරී/ඩිප්ලෝමාධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවා ගනු ලැබ 2020.01.01 සහ 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලැබූ කණ්ඩායම.

1.3 උක්ත කාණ්ඩවලට අයත් ස්ථිර පත්වීම් ලැබූ භික්ෂූන් වහන්සේලා.
(භික්ෂූන් වහන්සේලා ගුරු සේවයට පත් කිරීමේ දී, අංක 19/විවිධ(66) සහ 2019.12.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/11/07/04 (තාව) හා 2020.02.19 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.)

03. **අධ්‍යාපන සුදුසුකම් :-**

3.1 අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සටහන 6 වගන්තිය ප්‍රකාරව අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයක් වශයෙන් සමත් වීම.